සියළුම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved ]

## පාසල් වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

II පත්‍රය

නැණ ලොවට පා නඟන හපනුන්ට මඟ කියන

# "අදිති"

**13**

පැය 01 යි මිනි 15

විභාග අංකය ..............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- පිළිතුරු 3 ක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

**01. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ඡේදය ඇසුරින් ම ලියන්න.**

මහා වංශයේ සඳහන් පරිදි මවගෙන් වියෝ වූ ජීවහත්ථ හා දිශාලා සමන්තකූට පර්වතය ආශ්‍රිත ප්‍රදේශයට සිය ආරක්ෂාව පතා පලා ගිය බවකි. එහෙත් නිමක් නොපෙනෙන මහා වනය පිළිබඳ කිසිදු තොරතුරක් හරි හැටි නොදන්නා, එමෙන් ම බාහිර සමාජ ඇසුරින් මිදී සියලු සැප සම්පතින් පරිපූර්ණ වූ රාජ මාලිගය තුළ පමණක් හැදී වැඩුණු, ළාබාල වියෙහි පසු වූ කුඩා දරු දෙදෙනකු කිසිවෙකුගේ හෝ මඟපෙන්වීමකින් තොරව, ලංකා පුරයෙහි ලග්ගල ප්‍රදේශයේ සිට සමන්තකූටය වැනි අති දුෂ්කර වූ දුරස්ථ ප්‍රදේශයකට පලා යාම අතිශය ගැටලු සහගත ය. මෙහි දී ලක්දිව් පුරාණයේ හා මහා වංශයේ සඳහන් කරුණු එකිනෙක සසඳා බලන විට, මහා වංශයට වඩා, ලක්දිව් පුරාණයෙහි අන්තර්ගතය බොහෝ දුරට නිවැරදි යැයි උපකල්පනය කළ හැකි ය.

වැද්දෝ හෙවත් වන්නියලැත්තො
ධර්මසේන මහවෙල

i. මවගෙන් වියෝ වූ ජීවහත්ථ සහ දිශාලා පලා ගියේ කුමන ප්‍රදේශයකට ද?
.....................................................................................................................................

ii. ''වෙන් වූ'' යන අදහස දීමට ඡේදයේ යොදා ඇත්තේ කුමක් ද?
.....................................................................................................................................

iii. හල් කිරීම සහ දික් වක් පාපිල්ල පමණක් යෙදුණු වචනයක් ඡේදයෙන් සොයා ලියන්න.
.....................................................................................................................................

iv. ''නොමේරූ අවධියෙහි'' යන අදහස දීමට ඡේදය යොදා ඇති වචන මොනවා ද?
.....................................................................................................................................

v. කතුවරයා විශ්වාස කරන ආකාරයට, මහා වංශයට වඩා මේ පිළිබඳව බොහෝ කරුණු නිවැරදි යැයි උපකල්පනය කරන්නේ කුමන කෘතියෙහි ද?
.....................................................................................................................................

vi. කුඩා දරු දෙදෙනා සමන්තකූට ප්‍රදේශයට පැමිණියේ කුමන ප්‍රදේශයක සිට ද?
.....................................................................................................................................(ල 06)

02. උක්ත ආඛ්‍යාත සම්බන්ධය අනුව නිවැරදි පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.

i. අවුරුදු කාලයට කොහෝ ගීත ........................................................... (අසෙයි/ඇසෙති)

ii. මල්ලී අම්මා සමඟ පොළට ............................................................ (ගියේ ය/ ගියෝ ය)

iii. මුව රැළ පිට්ටනියට ....................................................... (අදෙයි / ඇදෙති)

iv තුරු පෙළ සුළඟට ............................................... (වැනෙයි / වැනෙති) (ල 4)

03. පහත වචනවල යටින් ඉරි ඇඳ ඇති අකුරට යෙදී ඇති පිල්ලම නම් කරන්න.

i. <u>රු</u>වල - ...................................... ii. පුභේදය ............................... (ල 2)

04. i. ස්ත්‍රී ලිංග ඒක වචන අනුක්ත පදය යටින් ඉරක් අඳින්න.
ළමයි, ගෙවිලිය, ගැහැනියක , සෙබඩ

ii. පුරුෂ ලිංග බහු වචන උක්ත පදය යටින් ඉරක් අඳින්න.
ළමයි, ඇත්තු , සමනලුන් , ගිරවුන් (ල 2)

05. පහත වගන්තියේ සුදුසු ස්ථානවල විරාම ලකුණු යොදන්න.
ඒ වියන් ඇඳ අපේ අත්තම්මලාගේ ගෙදරත් තියෙනවා ප්‍රබෝධ එකවර ම කී ය (ල 1)

06. පහත තුන් තේරවිලිවල හිස්තැන් පුරවන්න.

i. හෙන දළ
හෙන නම් ................................
දළ නම් ................................
........................, ........................

ii. වන්දි මුදල
වන්දි නම් ......................................
මුදල නම්......................................
.............................. , ..................... (ල 2)

07. නිවැරදි අකුර තෝරා හිස්තැන් පුරවන්න.

i. මා ............ ගය (ළි / ලි)    ii ආප ............ ශාලාව (ණ/න)    (ල 2)

08. පහත වචනවල අරුත් පැහැදිලිකර ලියන්න.

i. එකිනෙකින් ස්වාධීන ..........................................................................................

ii සුදම් දිවිය පුරයක් .......................................................................................... (ල 2)

09. පහත අදහස දෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.

සුදුසු නුසුදුසු දේ විචාර බුද්ධියෙන් නොවිමසා කටයුතු කිරීම

.......................................................................................................................... (ල 1)

10. පහත වාක්‍ය බහු වචනයට හරවා ලියන්න.

i. ඇය පාසලට යයි ..........................................................................................

ii. නැව මුහුදේ ගමන් කරයි. .......................................................................... (ල 2)

11. පහත අදහස දෙන ඉගිවැකි ලියන්න.

i. ඉටු නොවන සිහින මැවීම ..........................................................................

ii. දැඩි සේ බියට පත්වීම ...................................................................... (ල 2)

12. පහත රූපවලට සුදුසු ඉංග්‍රීසි වචන ඉංග්‍රීසි අකුරින් ම ලියන්න.

i.     ii. 

..............................    ................................    (ල 2)

13. පහත වගන්තිය ඉංග්‍රීසියට හරවා ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.

i. අපි ආපන ශාලාවට යමු ........................................................................ (ල 1)

14. පහත දෙමළ වචනවල සිංහල තේරුම ලියන්න.

i. පත්තොම්බදු ........................................................

ii. මල්ලිහෙප්පු ........................................................ (ල 2)

15. පහත යෙදුම දෙමළ බසින් සිංහල අකුරෙන් ලියන්න.

i. සුබ දීපවාලි දිනයක් වේවා ! .......................................................... (ල 1)

◆ **පහත ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.**

16. පහත සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න.

i. 30 037 ..........................................................................

ii. ඉහත සංඛ්‍යාවට 63 න් එකතු කළ විට ලැබෙන සංඛ්‍යාවේ, හරිමැද ඉලක්කමෙහි නිරූපිත අගය කීය ද? ........................................................................ (ල 2)

17. පහත ගැටලු විසඳා, පිළිතුරු රෝම සංඛ්‍යාවෙන් ම ලියන්න.

i. vi + xi = .........................    ii. xix - .vii = ...........................    (ල 2)

18. පෙ.ව 11.45 ට පමණ රැස්වීම ආරම්භ වී මිනිත්තු 30 කින් පමණ රැස්වීම අවසන් විය.

i. රැස්වීම අවසන් වූ වේලාව සාමාන්‍ය ඔරලෝසු වෙලාවෙන් ලියන්න.

..........................................................................

ii. රැස්වීම ආරම්භ වූ වේලාව සම්මත ඔරලෝසු වේලාවෙන් ලියන්න.

..........................................................................    (ල 2)


19. අඹ ගෙඩි 72 කින් $\frac{2}{8}$ ඉදී තිබුණි

i. එහි තිබූ අමු අඹ ගෙඩි ගණන කීය ද? ..........................................................................

ii. අමු අඹ ගෙඩියක් රුපියල් 10 බැගින් විකුණුවේ නම් එයින් ලැබුණු මුදල කීය ද?

රු. ...................................................................... (ල 2)

20. පහත රූපයෙන් දැකගත හැකි,



i. සෘජු කෝණ ගණන කීය ද? ..............................................................................................

ii. සෘජු කෝණයට වඩා වැඩි කෝණ ගණන කීය ද? ................................................... (ල 2)


21. පහත සංඛ්‍යාවලින් කුඩා ම සංඛ්‍යාව තෝරා යටින් ඉරක් අඳින්න.

i. $\frac{1}{2}$ , $\frac{3}{10}$ , 0.7 , $\frac{1}{5}$

ii. මෙම භාග හා දශම සංඛ්‍යා ආරෝහණ පිළිවෙලට පෙළ ගස්වා ලියන්න.


0.8, $\frac{4}{10}$, $\frac{1}{2}$, 0.3 ................................................................................ (ල 2)

22. පහත ගණක රාමු දෙකේ නිරූපිත සංඛ්‍යා අතර, වෙනස කීය ද?




= ............................................... (ල 2)

23. චමත් පාසලේ ස්ථාන කිහිපයකට ගමන් කළ ආකාරය රූප සටහනක් මඟින් දැක්වේ. ( ↑උ මඟින් උතුරු දිශාව දක්වයි.)





i. ඔහු ගමන් කළ මුළු දුර කොපමණ ද?.........................................................................

ii. දැන් ඔහු සිටින ස්ථානයට මුලින් සිටි ස්ථානය පෙනෙන්නේ කුමන දිශාවකින් ද?


........................................................................................................................ (ල 2)

24. පහත රූපයේ පාටකර ඇති කොටස දශම සංඛ්‍යාවක් සේ ලියන්න.



............................................... (ල 2)

25. පහතින් දැක්වෙන ජල බඳුන් තුන ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න




i. C බඳුනට වඩා A බඳුනේ කොපමණ ජල ප්‍රමාණයක් වැඩි ද? .......*l*..........*ml* (ල 1)

ii. B හා C බඳුන් දෙකේ ම ඇති ජලය ප්‍රමාණය කොපමණ ද? .............................. (ල 2)

26. අඩි රූලක් මත තබා ඇති පහත පැන්සල්වල දිග ප්‍රමාණයන් අනුව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




i. A පැන්සලේ දිග කොපමණ ද? ..............................................................................

ii. A පැන්සල වඩා B පැන්සල කොපමණ දිගින් වැඩි ද ? .................................. (ල 2)

27. පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 346.00 කි. රුපියල් 1000 නෝට්ටුවක් දී ඉන්ධන ඉහලකින් පෙට්‍රල් 3*l* ක් පුරවා ගත් අයෙකු, ඒ සඳහා තව කොපමණ මුදලක් ලබා දිය යුතු ද ?

රු .............................................................. (ල 2)

28. පහත කොටුව තුළ ඇති හයේ ගුණාකාර පිළිවෙළින් ලියන්න.

| | | |
|---|---|---|
| 18 | | 62 |
| | 46 | 36 |
| 48 | | 72 |
| | 34 | 54 |

.............................................................. (ල 2)


29. වාහනයක් විවිධ අවස්ථාවල ගමන්කළ වේගය හා එම වේගයෙන් ගමන්කළ කාලය දැක්වෙන සටහනක් පහතින් දැක්වේ.

| **ගමන්කළ කාලය** | පැය 3 | පැය $2\frac{1}{2}$ | පැය $\frac{1}{2}$ |
|---|---|---|---|
| **ගමන් කළ වේගය** | පැයට 60km | පැයට 50km | පැයට 30km |

i. වාහනය ගමන්කර ඇති මුළු කාලය කොපමණ ද? පැය ....................................

ii. වාහනය අදාළ කාලය තුළ ගමන්කළ මුළු දුර කොපමණ ද?................ km (ල 2)

30. පන්තියක සතියක් තුළ සිසුන්ගේ නොපැමිණීම දැක්වෙන තොරතුරු ඇතුළත් තීර ප්‍රස්තාරයක් පහතින් දැක්වේ.





i. ළමුන් අඩු ම ප්‍රමාණයක් පාසලට පැමිණ ඇත්තේ කවදා ද ?

..........................................

ii. පන්තියේ සියලු ම ළමුන් ගණන 37 ක් නම්, බ්‍රහස්පතින්දා පැමිණි ළමුන් ගණන කීය ද? ........................... (ල2)

◆ **ප්‍රශ්න අංක 31 - 59 තෙක් අසා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.**

31. පහතින් දැක්වෙන්නේ සූර්ය නමස්කාරයේ කීවෙනි ඉරියව්ව ද?



i. හයවන ඉරියව්ව
ii. තුන්වන ඉරියව්ව
iii. පස්වන ඉරියව්ව

32. පාට සුවඳ එක වගේ
තිබෙන රෝස මල වගේ'' .. කවිය ඇතුළත් 'හොඳ ළමයා' කවිපෙළ රචනාකර ඇත්තේ කවුද?

i කරුණාරත්න අබේසේකර මහතා ii මාර්ටින් වික්‍රමසිංහ මහතා
iii එස්. මහින්ද හිමි

33. පත්‍රවල පිහිටීම අනුව වෙනස් හැඩයක් ගන්නා පත්‍ර සහිත ශාකය තෝරන්න.

i. බුලත් ii. කොහිල iii. තිප්පිලි

34. $A_9$ මාර්ගයේ දී හමුවිය හැකි නගරයක් වන්නේ,

i. වවුනියාව ii. මාතර iii. කුරුණෑගල

35. අතීතයේ දී රජ පෙළපතේ හා උසස් ප්‍රභූවරුන් ගමනාගමනය සඳහා යොදාගත් ''දෝලාව'' සඳහා ශක්තිය යොදා ගනු ලැබුවේ,

i. ගවයන් මඟිනි ii. මිනිසුන් මඟිනි iii. ඉන්ධන මඟිනි

36. 

මෙම රූපයේ දැක්වෙන තැනැත්තිය හා සම්බන්ධ වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i. පළමු ඔලිම්පික් පදක්කම ශ්‍රී ලංකාවට ලබා දීම
ii. අලංකාර සිතුවම් නිර්මාණය කිරීම
iii. 200m කෙටි දුර ධාවන ඉසව්වෙන් ඔලිම්පික් රිදී පදක්කමක් ලබාදීම

37. අතීතයේ තුන් සිංහලයට අයත් රුහුණු රටේ පිහිටි ඓතිහාසික පුද බිමකි.

i. කතරගම දේවාලය ii. දළදා මාලිගාව iii. ශ්‍රී මහා බෝධිය

38. කබඩි ක්‍රීඩාව සඳහා එක් පිළකට ක්‍රීඩාකරන ක්‍රීඩකයින් ගණන වන්නේ, (අතිරේක ක්‍රීඩකයින් හැර)

i. 8 ii. 9 iii. 10

39.  මෙම රූපයෙන් දැක්වෙන අපේ රටට විශිෂ්ඨ සේවාවක්කළ ශ්‍රේෂ්ඨ පුද්ගලයා වන්නේ

i. ආචාර්ය සරත් ගුණපාල මහතා ii. ආතර් සී ක්ලාක් මහතා

iii. සෙනරත් පරණවිතාන මහතා

40. ගෙවත්ත පාඩමේ දී 3R සංකල්පය ට අයත් නොවන දෙයක් වන්නේ කුමක් ද?

i. භාවිතය අවම කරමු ii. අරපිරිමැස්මෙන් භාවිත කරමු

iii. ප්‍රතිචක්‍රීකරණය කරමු

41. ආදිවාසී සංස්කෘතියට අයත් ශාන්ති කර්මයකි

i. කිරි කොරහ නැටුම ii. සකලයන් හැඹීම iii. බීරංග ගැසීම

42. ''දුටත් යනෙන - විටත් දුවන
පිටත් පොට ගසා පනිමින'' මෙම වන්නම් කොටසට අදාළ සත්වයා වන්නේ,

i. හාවා ii. අශ්වයා iii. වඳුරා

43. ආරක්ෂක ආහාරයක් හා වර්ධක ආහාරයක් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

i දඹල හා කැරට් ii අන්නාසි හා දඹල iii කැරට් හා තක්කාලි

44. ජාතික කොඩියේ දැක්වෙන සංකේත අතරින් නොගැළපෙන අදහසක් සහිත පිළිතුර තෝරන්න.

i කොඩිය වටා ඇති කහපාට තීරුවෙන් ජාතික අභිමානය නිරූපණය කෙරේ.

ii කඩුව අතින් ගත් සිංහ රූපයෙන් සිංහල ජාතිය නිරූපණය වේ.

iii බෝපත් හතර මගින් සතර බ්‍රහ්ම විහරණ නිරූපණය කෙරේ.

45. සන්නිවේදනයේ ප්‍රධන අංග 3 කි.

i ශ්‍රව්‍ය මාධ්‍ය, දෘශ්‍ය මාධ්‍ය හා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය

ii ගුවන් විදුලිය, දුරකථනය, රූපවාහිනිය

iii යවන්නා, ලබන්නා හා මාධ්‍ය

46. රියදුරෙකු වට රවුමක දී ප්‍රමුඛතාවය ලබා දිය යුත්තේ,

i දකුණින් පැමිණෙන වාහනවලට ii වම් පසින් පැමිණෙන වාහනවලට

iii ඉදිරියෙන් පැමිණෙන වාහනවලට

47. සාම්ප්‍රදායික බට්ටා පැනීමේ ක්‍රීඩාව සඳහා යොදා ගත් දෙයක් වන්නේ,

i අඹ ඇට හා කදුරු ඇට ii මැටි වළං කටු හෝ අඹ ඇට

iii අඹ ඇට හෝ කජු ඇට

48. රූපයෙන් දැක්වෙන අපේ රටේ ශ්‍රේෂ්ඨ පුද්ගලයා වන්නේ,



i පොන්නම්බලම් රාමනාදන් මහතා

ii ආතර් ශ්‍රී ක්ලාක් මහතා

iii ආනන්ද කුමාරස්වාමි මහතා

49. සිහින්ව කපා ගැනීමෙන් හෝ වංගෙඩියට දමා කොටා ගැනීමෙන් මැල්ලුම් ලෙස ආහාරයට ගන්නා කොළ වර්ගයකි.

i අගුණකොළ ii වැල් දොඩම් කොළ iii මඤ්ඤොක්කා කොළ

50. පුළුස්සා ආහාරයට ගත හැකි බීජ වර්ග වන්නේ,

i කජු ඇට හා කොස් ඇට ii ලාවුළු ඇට හා කජු ඇට iii මී ඇට හා බුළු ඇට

51.  පහතින් දැක්වෙන්නේ ශ්‍රී ලංකා සිතියමකි. එහි අඳුරුකර ඇති පළාත් දැක්වෙන පිළිතුර තෝරන්න.


i වයඹ හා සබරගමුව
ii බස්නාහිර හා ඌව
iii ඌව හා සබරගමුව

52. ශරීරයට ප්‍රමාණවත් තරම් ජලය පානය නොකිරීමෙන් සිදු නොවිය හැකි දෙයකි.

i මුත්‍රාවල තද පැහැයක් ඇතිවීම. ii සිරුර අධික ලෙස තරබාරු වීම.
iii මුත්‍රා දැවිල්ල ඇතිවීම.

53. නිදහස් ශ්‍රී ලංකාවේ පළමු අග්‍රාමාත්‍යවරයා කවුද?

i සර් ඩී.බී. ජයතිලක මැතිතුමා ii සර් ජෝන් කොතලාවල මැතිතුමා
iii ඩී.එස්. සේනානායක මැතිතුමා

54.  වියළි කෝෂයට විදුලි බුබුළ හා වයර් කැබැල්ල මෙලෙස සම්බන්ධකළ විට විදුලි බුබුළ

i දැල්වේ.
ii නොදැල්වේ
iii යාන්තමින් දැල්වේ.


55. චුම්භකයක් ජලය මත පා කිරීමෙන් නිවැරදිව දිශා හඳුනාගත හැකි ය. මෙම කියමන,

i අසත්‍ය වේ. ii සත්‍ය වේ. iii ඇතැම්විට සත්‍ය වේ.

56. කළු ගඟ හා ගිං ගඟ මුහුදට වැටෙන පළාත් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

i කළුතර හා ගාල්ල ii කොළඹ හා ගාල්ල iii බස්නාහිර හා දකුණ

57. හඳෙහි වම්පස කොටසේ හරි අඩකට ආසන්නව පිරී ඇති මෙවැනි අවස්ථාවක් දැකගත හැකි ආසන්නම පොහොය දිනය වන්නේ,



i අව අටවක පොහොය
ii පුර අටවක පොහොය
iii අමාවක පොහොය

58. සූර්යග්‍රහණයක් හා චන්ද්‍රග්‍රහණයක් අනිවාර්යෙන් ම සිදුවිය හැකි දින දෙක පිළිවෙලින්,

i අමාවක පොහොය දිනක හා පසළොස්වක පොහොය දිනක
ii පසළොස්වක පොහොය දිනක හා පුර අටවක පොහොය දිනක
iii අව අටවක පොහොය දිනක හා පුර අටවක පොහොය දිනක

59. ජාතික ගීයේ කොටසක් පහතින් දැක්වේ. නිවැරදිව එහි හිස්තැන් පුරවන්න.
ඔබ අප ආලෝකේ - අපගේ අනුප්‍රාණේ
ඔබ අප ........................ - අප .............................. (ලකුණු 29)

60. පෙරදින වෙන්කරන ලද ප්‍රවේශපත් ද රැගෙන අපි දුම්රිය ස්ථානයට ගියෙමු. හදිසි දුම්රිය වැඩ වර්ජනයක් නිසා දුම්රිය ධාවනය නොවන බව එහි දී අපට දැනගන්නට ලැබුණි. මේ මොහොතට ඔබ මුහුණදුන් ආකාරය දැක්වෙන උක්ත ආඛ්‍යාත නිවැරදි වගන්ති 3 ක් ලියන්න. සෑම වගන්තියක ම වචන පහක් හෝ ඊට වැඩියෙන් තිබිය යුතු ය.

i ..........................................................................................................
..........................................................................................................
ii ..........................................................................................................
..........................................................................................................
iii ..........................................................................................................
..........................................................................................................

(ලකුණු 6)

(සමස්ථ ප්‍රශ්න පත්‍රයේ අත් අකුරු හා පිරිසිදු බවට ලකුණු 2 ක් ප්‍රදානය කෙරේ. )